**අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලිපි ශීර්ෂ නීති විරෝධී ලෙස යොදා ගනිමින් සිදු <u>කෙරෙන වංචනික ක්‍රියා පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම</u>**

විදෙස් රටවලින් ලැබීමට නියමිත බව හැඟවෙන පාර්සල් සහ නැව් බඩු සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තීරු බදු සහන අනුමත කර ඇති බවත්, ඒ සම්බන්ධව කටයුතු කිරීමට තමන් මැදිහත් විය හැකි බවක් හුවා දක්වමින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලිපි ශීර්ෂ වංචාකාරී ලෙස යොදා සකස් කරන ලද ව්‍යාජ ලිපි ඉදිරිපත් කරමින්, වංචාකාරී පුද්ගලයෙකු හෝ වංචාකාරී සංවිධානයක් විසින් යම් යම් පුද්ගලයින්ගෙන් මුදල් ලබා ගන්නා බවට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට තොරතුරු ලැබී ඇත.

02. කිසිදු පුද්ගලයෙකු වෙත විදෙස් රටවලින් ලැබෙන පාර්සල් හෝ නැව් බඩු සඳහා රේගු ආනයන බදු සහනයක් හෝ වෙනත් කිසිදු බදු සහනයක් ලබා දීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත නොකරන බව අවධාරණය කරන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා, එබඳු ව්‍යාජ ලිපිවලට නොරැවටෙන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටී. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර වංචාකාරී පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් පොලිස්පතිවරයාට දැනුම් දී ඇත.

03. අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් ලැබෙන කිසියම් ලිපියක නිර්ව්‍යාජභාවය තහවුරු කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා වෙත යොමු කෙරෙන ලිපියක් මඟින් හෝ එම කාර්යාලයීය ලිපි ශීර්ෂයේ සඳහන් 0112329620 හෝ 0112325279 අංක දරන දුරකථන මඟින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් ඇමතීමෙන් හෝ info@cabinetoffice.gov.lk විද්‍යුත් ලිපිනය හරහා කරුණු විමසීමෙන් හෝ තහවුරු කර ගත හැකිවේ.